කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී පළමු වසර පරීක්ෂණය - පළමු සෙමෙස්තරය - 2019/2020

**INR 1101 - ජාත්‍යන්තර සබඳතා පිළිබඳ හැඳින්වීම**

කාලය - පැය දෙකයි (02)

ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

---

1. ප්‍රශ්න දෙකටම (02) පිළිතුරු සපයන්න.
   i. ජාත්‍යන්තර සබඳතා අධ්‍යයන විෂයක් ලෙස නිර්වචනය කරන්න.
   ii. ජාත්‍යන්තර සබඳතා සුවිශේෂී අධ්‍යයන ක්ෂේත්‍රයක් ලෙස ඔබ සිතන්නෙහි ද? උදාහරණ ඇසුරෙන් ඔබේ පිළිතුර සනාථ කරන්න.

2. පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් ජාත්‍යන්තර සබඳතා අධ්‍යයන විෂයක් ලෙස වර්ධනය වීමේ අදියර විස්තර කරන්න.
   i. විෂයේ වර්ධනයට බලපෑ සිද්ධි
   ii. ප්‍රධාන ප්‍රවේශයන්
   iii. අවධාරණයේ සිදු වූ වෙනස්කම්

3. ප්‍රශ්න දෙකටම (02) පිළිතුරු සපයන්න.
   i. ජාත්‍යන්තර සබඳතා හි 'ප්‍රවේශයක්' යනු කුමක්ද?
   ii. ජාත්‍යන්තර සබඳතා හි ඕනෑම සම්භාව්‍ය ප්‍රවේශ දෙකක් (02) සංසන්දනය කරන්න.

4. ප්‍රශ්න දෙකටම (02) පිළිතුරු සපයන්න.
   i. ජාත්‍යන්තර සබඳතා තුළ 'යුද්ධය' නිර්වචනය කරන්න.
   ii. සමස්ත සහ සීමිත යුද්ධ යන සංකල්ප සංසන්දනය කරන්න.

5. ප්‍රශ්න දෙකටම (02) පිළිතුරු සපයන්න.
   i. ජාත්‍යන්තර දේශපාලනය බලය සඳහා වන අරගලයක් ලෙස හාන්ස් ජේ. මෝගන්තෝ නිර්වචනය කර ඇත. මෙම අදහස ඔස්සේ ජාත්‍යන්තර සබඳතා තුළ බලය යන සංකල්පය කෙටියෙන් නිර්වචනය කරන්න.
   ii. බලය පිළිබඳ සංකල්පය තේරුම් ගැනීමට ක්ලයින් සමීකරණයේ (Cline Formula) අදාලත්වය විස්තර කරන්න.

6. ප්‍රශ්න දෙකටම (02) පිළිතුරු සපයන්න.

   i. ජාතික අභිලාෂය රාජ්‍යයන්ගේ අනෙක් අභිලාෂ වලින් කෙසේ වෙනස්වන්නේ දැයි පැහැදිලි කරන්න.

   ii. රාජ්‍යයන් සෑම විටම උත්සහ දරන්නේ ඔවුන්ගේ ක්‍රියාකාරකම් ජාතික අභිලාෂය මත පදනම් ව සාධාරණීකරණය කිරීම බව ඔබ සිතන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

7. ප්‍රශ්න දෙකටම (02) පිළිතුරු සපයන්න.

   i. ආරක්ෂාව පිළිබඳ සංකල්පයට අදාල ඕනෑම ශාස්ත්‍රීය අර්ථනිරූපණ දෙකක් (02) කෙටියෙන් සාකච්ඡා කරන්න.

   ii. මානව සුරක්ෂිතතා සංකල්පයේ මූලික ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න.

8. පහත දැක්වෙන ඕනෑම මාතෘකා දෙකකට (02) කෙටි සටහන් ලියන්න.

   i. ගෝලීයකරණය පිළිබඳ සංකල්පය

   ii. කලාපීය ඒකාග්‍රකරණය පිළිබඳ සංකල්පය

   iii. ජාත්‍යන්තර සබඳතා තුළ පාත්‍රයන්

   iv. බැරී බූසාන් නිර්වචනය කරන ලද සුරක්ෂිතතාවයේ අංශ